# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,876/1 — 1969 ඔක්තෝබර් 19 වැනි ඉරිද — 1969.10.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩි.-බී. 6/69

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3), 14 සහ 20 යන වගන්ති යටතේ, රාජ්‍ය ඇමැතිවරයා විසින් පනවනු ලැබූ නියෝග.

ජේ. ආර්. ජයවර්ධන,
රාජ්‍ය ඇමති.

1969 ඔක්තෝබර් 15,
කොළඹ.

**නියෝගය**

1. 1969 අගෝස්තු මස 9 වැනි දින හා අංක 14,866/2 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවුණු 1969 ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ (විශේෂ විධිවිධාන) නියෝගවල, උප ලේඛනයේ පළමුවන ඡේදයේ ''දෙපාර්තමේන්තුව'' යන වචනය වෙනුවට ''පාලක'' යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් ඒ නියෝග සංශෝධනය කරනු ලැබේ.

2. 1969 අගෝස්තු 9 දින හා අංක 14,866/2 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවුණු 1969 ආනයන (නිදහස් කිරීම්) නියෝගවල 2 වැනි නියෝගයෙහි (3) ඡේදය වෙනුවට පහත දක්වෙන අලුත් ඡේදය යෙදීමෙන් එම නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :

''(3) එතෙර වෙළඳ ආයතන විසින් ස්වකීය මෙරට නියෝජිතයනට නොමිලේ එවනු ලබන

(අ) සාමාන්‍ය විවෘත බලපත්‍ර හෝ වෙළඳ පංගු බලපත්‍ර මත ආනයනය කළ හැකි බඩු වන්නාවූ ද,

(අ ) ඖෂධවල ආදර්ශ හැර, එබඳු ආදර්ශ වෙළෙඳ භාණ්ඩ තනි තොගයක මි.ර.ප්‍ර. වටිනාකම රු. 1,000 නො ඉක්මැවිය යුතු වන්නාවූ ද,

(ඇ) ආදර්ශ වෙළෙඳ භාණ්ඩ වාණිජමය ප්‍රමාණවලින් හෝ වෙළඳාම සඳහා හෝ ආනයනය නොකළ යුතු වන්නාවූ ද ආදර්ශ වෙළෙඳ භාණ්ඩ''.

10—902

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**අංක 21/69 දරන ආනයන පාලන දැන්වීම**

**(අංක 20/69 දරන ආනයන පාලන දැන්වීම සංශෝධනය)**

**අයිතිය ප්‍රකාශිත ඖෂධ ආනයනය**

1969 ඔක්තෝබර් 5 දින නිකුත් කැරුණු අංක 14,874/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවුණු අංක 20/69 දරන ආනයන පාලන දැන්වීමෙහි ''අංක 4 ලැයිස්තුවට එකතු කිරීම් අයිතිය ප්‍රකාශිත ඖෂධ'' යටතේ එන සීමා සහිත එච්. ආර්. නැප් නිෂ්පාදක සමාගම යටතේ දක්වෙන ''පි.සී.එම්. පෙති'' යන්න කපා හැරීමෙන් යථෝක්ත ආනයන පාලන දැන්වීම සංශෝධනය කැරෙන බව ආනයනකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. ජේ. එච්. ගුණසේකර,
ආනයන හා අපනයන පාලක.

1969 ඔක්තෝබර් 19,
කොළඹ.

10—901

1A——ජේ 7632—12,900 (69/10)

## රේගු නිවේදනය—අංක 61/9/412

ආදයම් සංරක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු මස 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1969 ඔක්තෝබර් මස 20 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තු වලට අතිරේක වශයෙනි :—

**රබර්**

| | රු. | ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම—රාත්තලකට ... | 1 | 39 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට — — ... | 0 | 26 |

ඒ. ථි. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ.781,
1969 ඔක්තෝබර් 19 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

10–904

---

## රේගු දැන්වීම—අංක 67/3/100

1967 නොවැම්බර මස 22 වැනි දින අංක 14,775/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1968.2.22 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1969 ඔක්තෝබර් මස 20 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරා වල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,229.77 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ. :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අමු පොල්ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව | |
|---|---|---|---|---|---|---|---|
| රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| 369 | 94 | 414 | 29 | 351 | 82 | 92 | 49 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තු වලට අතිරේක වශයෙනි.

ඒ. ථි. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 744/22,
1969 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

10–903

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

සැ.යු.—14,875/1 කාණ්ඩයේ අවසාන අති විශේෂ ගැසට් අංකය 14,875/6